සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මேல் மாகாணக் கல்வித் திணைக்களம் Department of Education - Western Province

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

## පිළිතුරු පත්‍රය
## Marking Scheme

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## I කොටස

(01) (i) (අ) සුද්ධෝදන මහරජතුමා

(ආ) දරුපෙම් - නන්ද කුමාරයාට ඇති ආදරය
මුණුබුරුපෙම් - රාහුල කුමාරයාට ඇති ආදරය

(ii) (අ) කුද විසින් කුස රජුට

(ආ) උන් - ප්‍රභාවතී දේවිය

(iii) (අ) ඉයෝනා

(ආ) ඇන්තන් චෙකෝෆ්

(iv) (අ) සාගර පලන්සූරිය (1910 - 1961)

(ආ) සුදෝ සුදු / මල්හාමි / කාලකණ්ණියා / කන්දේ ගෙදර / විසිවුණු තරු / කැලණි විත්ති / පිළිරුව හා අපේ ඇත්තන්ගෙ විත්ති

(v) (අ) කිඳලෙක - කුඩා දිය වළෙකි
සුනෙර - මහාමේරු පර්වතය

(ආ) උතුම් වූ ස්ථිරසාර ගුණයෙන් යුක්ත වූ උතුමකුට මුළු මහත් සාගරය කුඩා දිය කඩිත්තකි. මහාමේරුව තුඹසකි. සුප්‍රද්ධ ජම්බු ද්වීපය තමාගේ ගෙදර මිදුල ය. එබැවින් ඔහු අතට පත් නොවන සැපතක් නැත. (ලකුණු 4 × 5 = 20)

(02) (i) උදැසන ඉර පෑයීම සම්බන්ධව කථකයා හෙළන අකමැත්ත

(ii) උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය මනා ලෙස භාවිතයට ගැනීම
උදා :- මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
සරල කාව්‍යමය භාෂාවක් යොදාගෙන තිබීම
උදා :- කුරුල්ලන්ට ගල් ගහලා

(iii) නිසඳැස් කාව්‍ය ආකෘතිය වේ. සම්ප්‍රදායිකව ඉර පෑයීම කාව්‍ය ආනුභූතිය කොට ගත්ත ද ඉන් ප්‍රකාශ වන්නේ ඉර පෑයීමේ අප්‍රසාදය පළ කිරීම ය. මේ සඳහා සම්ප්‍රදායික කාව්‍ය ආකෘතිය වෙනුවට නූතන කාව්‍ය ආකෘතිය යොදාගෙන තිබේ.

(iv) කවියාගේ විශේෂත්වය වන්නේ උපමා සම්ප්‍රදායික ලෙස භාවිත නොකිරීමයි. කාව්‍ය භාෂාව ලෙස පෙරදිග ගොරහැඩි රකුසෝ, කලු රෙදි පොට ආදී වශයෙන් රූපකාර්ථ භාෂාවක් භාවිත කොට තිබේ.

(v) කවියා ප්‍රබල ලෙස ව්‍යංගාර්ථ ඉස්මතු කරයි. නින්දට කැමැති පුද්ගලයකු ඉර පෑයීමේ නොසතුට ප්‍රකාශ කරන්නේ අවට පරිසරය තුළිනි. කුරුල්ලන්ට ගල් ගහලා, මල් පොහොට්ටු තිගැස්සිලා යන්න තුළ ප්‍රබල ව්‍යංග්‍යාර්ථ ඉස්මතු වේ.

(ලකුණු 25)

## II කොටස

(03) (i) මහණ කර ගැනීමේ අරමුණ ඇතිව නන්ද කුමරු අතට පාත්‍රය දෙන සේක. බුදුන් වහන්සේ සමඟ පාත්‍රය රැගෙන නන්ද කුමරු වෙළුවන වෙහෙරට ගියේ ය.

(ii) දිවුල් ලාටු මුසු වයිති තරව වැද ගන්නා සේ

(iii) බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් යුක්තව, පාත්‍රය අරගත මැනවියැයි කියා ගැනීම නොහැකිව දැන් පාත්‍රය අරගනියි යන අදහසින් යුක්තව

(iv) කතාකරු අපූරු ආකාරයට අවස්ථාවට උචිත සරල භාෂාවක් භාවිතා කිරීම උදා :- බුදුහු එතන දිත් පාත්‍රය හැර නොගත් සේක්...
සංකල්ප රූප නැංවෙන ආකාරයට භාෂාව ඉස්මතු කිරීම
උදා :- සෝධා නොනිමි හිස කේ නොබැඳ වහා අවුත්....

නැතහොත්

(i) කුඩා කල සිට දන්නා මිතුරෙකු අධ්‍යාපනයෙන් රැකියාවෙන් උසස් තලයකට පැමිණීමෙන් පසුව වෙනස් වූ ඔහුගේ චර්යාව

(ii) කිවිදිය සරල භාෂාවක් යොදාගෙන තිබේ. එක් යුගයක ජීවිතයේ සරතස නිවූ.... ආදී වශයෙන් කටවහරට සමීප සරල භාෂාවක් යොදා ගනියි. භාෂාවේ සරල භාවය නිසා කවිය තුළ සජීවී ගුණය ඔප් නැංවේ. එමෙන් ම උපමා භාවිතයෙන් තොරවීම ද සරල භාෂාව කවිය රසවත්වීමට හේතු වේ.

(iii) දෙපද කාව්‍ය ආකෘතිය
උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය
සංකල්ප රූප
ව්‍යංගාර්ථ

(iv) කථකයාගේ හදවතේ දැනෙන ශෝකී රසය ඔප්නැංවීමට දෙපද කාව්‍ය ආකෘතිය යොදාගෙන තිබේ. ශබ්ද රසය සංතාපය තිව්‍ර කිරීමට ඉවහල් වේ. (ලකුණු 25)

## III කොටස

(04)
- කරච්චලේ, ඉක්මනට යනව ද නැද්ද?
- නමය පහුවෙලා උඹ මොකද නැවතිලා ඉන්නෙ
- ''ඈ බොල. උඹ බඩ පුරවා ගන්නවා ද?'' ආදී උදාහරණ මගින් තහවුරු වන්නේ සිංහල කටවහර සමීප භාෂාවක් භාවිතා කොට ඇති ආකෘතියයි.
  (සුදුසු ආකාරයට පිළිතුරු සපයන්න.)

(05) සරල භාෂාව
කාව්‍ය ආකෘතිය
සංවාද යෙදීම
සංකල්ප රූප ඉස්මතු වීම ආදිය කෙරෙහි අවධානය යොමුකරමින් ලකුණු දෙන්න.

(06) විරහව, වේදනාව, සතුට ආදි මනුෂ්‍ය සිත් තුළ පහළ වන හැඟීම් ජන කවියා තම කාව්‍ය උදෙසා භාවිතා කොට තිබේ. සුදුසු පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න.

(07) සීලවතී බිසවට දරුවන් නොමැති වීම
සීලවතී බිසවට මහලු බමුණාට රැගෙන යාමට ලබාදීම
සීලවතී බිසවට දරුවන් ලැබීම
කුස රජුට විවාහයක් සෙවීම
කුස රජුට ප්‍රභාවතී විවාහ කරදීම වර්තමාන කතාව තුළ අතීත කථාව යොදාගැනීම
ප්‍රභාවතී කුස රජුට බිය වී තම නුවරට යාම ආදි අතුරු කතා කෙරෙහි අවධානය යොමු කරමින් ලකුණු ලබාදෙන්න. (ලකුණු $15 \times 2 = 30$)